17

මගේ අංකය - NCP/CS/ED/11/5/3
ප්‍රධාන ලේකම් කාර්යාලය,
උතුරු මැද පළාත.

2020/05/26

ආයතන චක්‍රලේඛ 2020/01

ආණ්ඩුකාරවර ලේකම් ,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්,
සියලුම පළාත් අමාත්‍යාංශ ලේකම්වරුන් ,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන් හා
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත ,

<u>උතුරු මැද පළාත් සභාවේ පුනරාවර්තන වියදම් පාලනය.</u>

උතුරු මැද පළාත තුළ 26000 ට ආසන්න සේවක සංඛ්‍යාවක් සේවයේ නියුතු වන අතර , 2020 වර්ෂය සඳහා අයවැය ලේඛනයක් සම්මත නොවීම මත අතුරු සම්මත ගිණුමක් මඟින් වැටුප් හා වේතන ඇතුළු අත්‍යාවශ්‍ය පුනරාවර්තන වියදම් දැරීම පමණක් සිදු කෙරෙන බව ඔබ සියලුදෙනාම දන්නා කරුණකි.

02. එසේම රට මුහුණ දුන් කොවිඩ් 19 රෝගී තත්වය ව්‍යාප්තිය වැලැක්වීම සඳහා නිවසේ සිට රාජකාරි සිදු කිරීමට ලබා දුන් පහසුකම් තත්වයද භුක්ති විඳිමින් 2020 මාර්තු , අප්‍රේල් මාසයන්හි සම්පූර්ණ වැටුප් රජයේ නිලධාරීන් වෙත ලබා දීමද සිදු කරනු ලැබූ බවද සිහිපත් කරනු කැමැත්තෙමි. 2020 මැයි 11 දින සිට රාජ්‍ය ආයතනයන්හි සාමාන්‍ය රාජකාරි ආරම්භ කිරීමත් සමඟ කොරෝනා රෝග ව්‍යාප්තිය පාලනයට සෘජුව සම්බන්ධ වෙමින් කටයුතු කරන ලද දෙපාර්තමේන්තුවලින් බැහැරව ඇතැම් අවස්ථාවලදී ඊට යම් මට්ටමකට අදාළව සිදු කළ කාර්යන් ද එදිනෙදා සාමාන්‍ය රාජකාරි කටයුතු ද හුවා දක්වමින් ඇතැම් දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් ඇතැම් නිලධාරීන් වෙනුවෙන් දැනට අනුමත අතිකාල දීමනා , නිවාඩු දින වැටුප් සීමා ඉක්මවමින් අතිරේක දීමනා අපේක්ෂාවෙන් ඉල්ලීම් කිරීමේ ප්‍රවණතාවයක් දක්නට ඇත.

03. රාජ්‍ය ආදායම් රැස්කිරීමේ කාර්යයන් තවමත් නිසි පරිදි යාවත්කාලීන නොවූ අවදියක පළාත් සභාවේ වියදම් ද දැඩි පාලනයකින් සිදු කිරීම දැඩිව අවධාරණය කල යුත්තකි. එබැවින් ගෙවීම් පාලනය සම්බන්ධව රජය විසින් සෘජුවම වගකීම් පවරා ඇති රාජ්‍ය නිලධාරීන් හැරුණු විට සෙසු රජයේ නිලධාරීන් අතිකාල සේවයේ යෙදවීම නිවාඩු දින වැටුප් මත සේවයේ යෙදවීම සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ විධිවිධානයන් හා ඒ සම්බන්ධ වරින් වර නිකුත් කර ඇති චක්‍රලේඛ හා රෙගුලාසි ඇතුළු අනෙකුත් විධිවිධානයන් තරයේ අනුගමනය කරන ලෙස නැවත වරක් අවධාරණය කරමි.

04. එමෙන්ම කොවිඩ් 19 වසංගතය පවතින මෙම කාල සීමාවේදී රාජකාරි සඳහා නිලධාරීන් චක්‍රිය පදනමින් යොදවා ගැනීමටත් ඉතාමත් අත්‍යවශ්‍ය හා ඉතා කඩිනමින් සිදු කළ යුතු කාර්යන් වේ නම් පමණක් ඔබගේ සීමාව තුළ පිහිටා අතිකාල සේවයේ යෙදවීමටත් වග බලා ගන්නා ලෙස කාරුණිකව දන්වමි.

05. දෙපාර්තමේන්තු ප්‍රධානීන් , අමාත්‍යාංශ ලේකම්වරුන් සෘජුවම තම සීමා තුළ රැඳීම ද ප්‍රශස්ත මූල්‍ය කළමනාකරණයක් සඳහා අභ්‍යන්තරිකව ඒ සඳහා සුදුසු ක්‍රමවේදයන් සකස් කරවා ගනු ඇතැයි ද අපේක්ෂා කරමි.